# ගෝවින්ද සහ වනිගරත්න

## තවදුරටත් සොයමු

පසුගිය කළාපයේ අනුර හොර්ෂස් ගේ ගෝවින්ද සහ වනිගරත්න පවුල ලිපියට පිළිතුරු වශයෙනි.

**සමාජ ගවේශක විසිනි.**

**අනුරගේ ලිපිය** කියවීමේදී මට හැඟී ගිය වැදගත්ම කරුණ නම්, ලිපියේ අඩංගු එක් එක් උදාහරණ අප සමාජයේ බහුතරයකට කෙලින්ම අදාල නොවුනත්, ඔස්ට්‍රේලියාව වැනි විදේශ රටක ජීවත් වන බොහොමයක් ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට සහ ඔවුන්ගේ දෙමව්පියන්ට තදින්ම බලපාන, හිතට වද දෙන, එහෙත් වෙන කා හටත් කියාගත නොහැකිව හිතේ තද කරගෙන තනිවම පීඩා විඳින, බරපතල ප්‍රශ්නයක් පිළිබඳ ඉඟියක් මෙම කතුවරයා විසින් ඉදිරිපත් කරණු ලබන බවයි.

එකම ප්‍රශ්නයකට විසඳුම් සෙවීමේදී වුවද, එකම විසඳුම සෑම දෙනෙකුටම ගැලපෙන්නේ නැත. එම නිසා මෙහිදී වැදගත් වන්නේ, සුවිශේෂිත විසඳුම් ඉදිරිපත් කිරීමට වඩා, මෙම බැරෑරුම් ප්‍රශ්නය සහ එහි පසුබිම තව දුරටත් විශ්ලේෂණය කිරීමයි. ප්‍රශ්නයක් හොඳින් විශ්ලේෂණය කරනු ලබන සමහර අවස්ථා වලදී, එය ඇත්තෙන්ම ප්‍රශ්ණයක් නොවන බව වුවද පෙනී යා හැක.

තව දුරටත් මෙම ප්‍රශ්නය විශ්ලේෂණය කිරීම සඳහා ඔබගේ අදහස් ගලා ඒම පහසු වනු පිණිස, පහත සඳහන් ප්‍රශ්න වැල පාඨක ඔබ වෙත ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

1. මෙරට ෆාස්ට් ගණයේ සමාජයක ෆාස්ට් ගතිගුණ ඇතිව හැදුණ වැඩුණ කොල්ලෙකුට වඩා හොඳින් ගැලපීමට ඉඩ ඇත්තේ මෙරට හැදුණ වැඩුණ ෆාස්ට් කෙල්ලෙක්ද, නැතිනම් මෙරටදී වැරදි නැතැයි පිළි ගන්නා ෆාස්ට් ගතිගුණ පිළිබඳව කිසිම අදහසක් නොමැති ලංකාවේ හැදුණ වැඩුණ කෙල්ලෙක්ද ?

2. කොල්ලන් හා සමාන කාලයක් සහ ශ්‍රමයක් කැප කර පූර්'ණ කාලීන රැ කියාවක නියුතු මෙරට නූතන කෙල්ලෙකුගෙන්, දශක කිහිපයකට එපිට ලංකාවේ රැකියාවක් නොකළ ගෘහණියකගෙන් ඉටු කෙරෙන ලද සියළුම වැඩ කටයුතු තනිවම කර දීමක් බලාපොරොත්තු විය හැකිද ?

3. ඉහත සඳහන් යතාර්ථය සම්බන්ධ නිවැරදි ආකල්ප තම පුතුන්ගේ සිත් වල වර්ධනය කිරීමෙහිලා ඔවුන්ගේ දෙමාපියන් කෙතරම් සැලකිල්ලක් දක්වා ඇද්ද ?

4. කෙල්ලෙක් තම සහකරු සඳහා සුදුස්සෙක් තෝරා ගැනීමේදී, පෘථග්ජන මිනිසෙකුගෙන් බලාපොරොත්තු විය නොහැකි තරමට උවමනාවට වඩා සුදුසුකම් සලකා බලන්නේ ද ?
5. කුඩා කළ පටන් මෙරට හැදුණු වැඩුණු ලාංකික තරුණ තරුණියන් සහ සෑහෙන කළක් ලංකාවේ අධ්‍යාපනය ලබා මෙරටට පැමිණි ලාංකික තරුණ තරුණියන් අතර සිතුම් පැතුම් වල සෑහෙන ප්‍රමාණයක වෙනසක් දැකිය හැකිද ?

6. තම දෙමව්පිය දෙදෙනා අතරේ පවතින නිරන්තර ගැටුම් අද්දැකීමෙන් විවාහය සම්බන්ධ බියක් හා සැකයක් යටි හිතේ හෝ පැවතීම නිසාම විවාහ නොවී ඉන්නා කොල්ලන් සහ කෙල්ලන් කොපමණ ඇද්ද ?

7. මෙරට තුළ පදිංචි ව සිටියදී තනිකර ශ්‍රී ලාංකික සංස්කෘතියම පදනම් කරගත් ජීවිතයක් ගත කිරීමට තම දරුවන් පෙළඹවීමෙන්, ඔවුන් නිවසින් බැහැරව මෙරට සමාජයට තනිව මුහුණ දීමේදී මොන විදියේ ගැටළු වලට මුහුණ දීමට සිදු වන්නේද ?

8. දරුවන් ඇති දැඩි කිරීමේදී, මිතුරු මිතුරියන් ඇසුරු කිරීම සීමා කරමින් දරුවන්ව නිවසේ කොටු කර ගැනීමත් සමාජ ආශ්‍රය පිළිබඳ අද්දැකීම් දරුවන්ට වර්ධනය කිරීමත් අතර සමතුළිතතාවයක් ඇති කර ගන්නේ කෙසේද ?

## කතුර ගේ මායය







### සියළු රෝග සුව වී SB නිදහස්

S.B. ගැන පත්තර ඕනේ තරම් පසුගිය දවස්වල කථා කළා. S.B. කියන්නේ පැහැදිලිවම කථා කල යුතු චරිතයක් නෙවෙයි. තවත් එක් මුබරි දේශපාලඥයෙක් පමණයි. ජනපතිතුමා S.B. නිදහස් කිරීමෙන් එක ගලින් කුරුල්ලෝ දෙන්නෙක් මරණ සුදානමක් තිබෙන හැඩක් පේනවා. S.B. නිදහස් කිරීම තුල UNP එකේ අර්බුදය උත්සන්න කිරීම එකක්, නුදුරු අනාගතයේදී එන්නට ඉඩ ඇති ආණ්ඩුව බිඳ හෙලීමේ J.V.P. තර්ජනයට මුහුණදීමට සුදානම් වීම තවත් එකක්. සෑම දෙයක්ම සිදුවන්නේ සීරු මාරුවට. වසරක් පුරා හිස්ව තිබුණු S.B. ගේ මන්ත්‍රී ධූරය පිළිබඳව JVP එක හරහා පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරවලා රේනුකා හේරත්ව එතනට ගේනවා. ඒ හරහා S.B. හා JVP එක අතර වෛරයක් ගොඩ නගලා S.B. ව JVP එකට විරුද්ධව ඕනෑම පියවරක් ගැනීමේ තත්ත්වයට පත් කරනවා. යන විදිහට".SB. ට ප්‍රජා අයිතියත් ලැබේවී. එහි ප්‍රතිඵලය S.B. U.N.P. එකේ ඉහලට කෙසේ වෙතත් යමක් කළ හැකි තැනකට ඒවි. S.B. හා ඔහු වටා ඉන්න පිරිස කොහොමත් ජනපතිතුමාගේ මිත්‍රයෝනේ. බරපතලව කරුණ නම් මෙයයි. SB මේ වෙනකොට පෙඩරල් ක්‍රමයට පක්ෂයි. මහින්ද චින්තනේ මොනවා තිබුණත් මේ ජිනීවා සාම සාකච්ඡා පෙර සුදානම හරහා මුළු රටේම ජනතාව යුධ විරෝධි මානසිකත්වයට ගෙනත් තියෙන්නේ. මහින්ද කියන්නේ රටට ජනතාවට ඇහුම්කන්දෙන නායකයෙක් කියන පදනම දැන් හැදිලා ඉවරයි. මේ සාම සාකච්ඡා අවසානයේ පෙඩරල් ක්‍රමයේ බලය බෙදීමකට (ලෝක බලපෑමක් සහිතව) රජය එකඟ උනොත් JVP එකේ ඒකීය රාජ්‍ය පදනම ජනතාව අතරින් බිඳ දැමීමට SB හොද අත්වැලක් වෙයි මහින්දට. J.R. කියන්නේ ඉවසිල්ලෙන් තමන්ට ඕනේ දේ තමන්ම කරපු මිනිහෙක්. මහින්ද බොහොම ඉවසිල්ලෙන් ඉදලා තමන්ට උවමනා දේ අනුන් ලවා ලබා ගන්න මිනිහෙක්. ඒකෙදි මහින්දට SB හොද කරුවක් වෙයි. SB කොහොමත් ගැලපෙන්නෙ UNP එකට නෙවෙයි. ඔය කොයිතරම් දැඟලුවත් SB ට UNP නායකයා වෙන්න බෑ. එක ඉඩ ලැබෙන්නෙ නැහැ. SB ගේ වේගය වැඩියි. SB යන තැන කාලයා තීරණය කරයි.

### ටෙක් එකට

ජර්මානු කාර්මික අභ්‍යාස විදුහලේ ආදි ශිෂ්‍ය සංගමය හෙවත් ටෙක් එකේ කට්ටියට බොහෝ මිත්‍රශිලීව අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. ඔබලා සංවිධානය කරන සිංහල අළුත් අවුරුදු උත්සවය ගැනයි කියන්නේ. මව්බිමින් පිටව ඇවිත් මෙවැනි රටක මෙවන් උත්සවයක් වසර ගණනාවක්ම නොකඩවා පවත්වන එක සතුටට කරුණක්. අපේ ජාතික සිරිත් විරිත් ක්‍රීඩා සංස්කෘතික අංග අපි රකින්න ඕනෙ. ඒක ඇත්ත. මිත්‍රවරුනි මොනම හොද දේ උනත් එකම විදිහට එකම රටාවට එක දිගටම සිදුවෙන කොට එකේ අගය වටිනාකම අඩු වෙනවා. නිකම් හිතලා බලන්න. මේ උත්සවයට එන සෙනග දැන් වසර කීපයක ඉඳලා අඩුවීමක් පෙන්නුම් කරන්නේ නැද්ද? මිනිස්සු හැමදාම පොල්ගාලා, දුවලා, කොට්ට පොර බලලා සතුටු වෙන්නෙ නැහැ. අපි ජිවිත කාලෙම ඕව දැකලා ඇති වෙලා තියෙන්නේ. දැන් මිනිස්සු දන්නවා මෙතනට එනකොට මොනවද වෙන්නෙ කියලා. ඔබලා මේකට විකල්පයක් සෙවිය යුතුයි. මිනිස්සුන්ට අළුත් ඉදිරිපත් කිරීමක් කළ යුතුයි. මිනිස්සු හැමවිට නවතාවයට, ඉදිරියට යන්න කැමති ජාතියක්. අඩුම තරමින් ආධුනික ගී තරඟයක්වත්, සතුටු මෙන්ම කුසලතාවයකට අතදීමක් හැටියට... අදහසක් විතරයි. ඔබලාට මේ මෙල්බන්වල වැඩිම සාමාජිකයන්, සංවිධාන ශක්තිය, ආර්ථික ශක්තිය නොඅඩුව තිබෙනවා. හොඳ ක්‍රියාත්මක කල හැකි අදහසක් පමණයි අවශ්‍යය. මේ වටිනා උත්සවය දියවෙන්න දෙන්න එපා. අළුත් අංග එක් කරමින් නවතාවයකින් ජනතාව එක් රොක් වන වැඩසටහනක් ඉදිරිපත් කිරීමට ශක්තිය හා අදහසක් පහලවේවායි පතනවා.

### ZZZ

මෙල්බන් හි සිංහල ප්‍රජා ගුවන් විදුලිය ගැන ලියන්නේ නොලිය බැරි තත්ත්වයක් දැන් උදාවෙලා තියෙන නිසයි. ගුවන් විදුලියක ඇති වටිනාකම ලියන්න මෙය අවස්ථාවක් නොවූනත් ඒ වටිනාකම දැන් දැන් ''නින්ද ගිය රජාව ආරක්‍ෂා කර ගන්න වදුරා අතට දුන්න කඩුවෙන් වදුරා කරපු දේට සමානයි'' වගේ.

මේ ZZZ අකුරු තුනේ අයිතිය ලබා ගන්න (සමාවෙන්න ජනතාව දැනුවත් කරලා විනෝදය ලබා දෙන්න) බොහෝ පිරිස් උත්සාහ කළ හැටි සංක්‍රමනිකයා දැසින්ම දැක්කා. ඒත් ඒ උත්සාහය තුළ එක් හොඳ දෙයක් සිදුවුණා. ඒ කාරිය කරවන ඇත්තෝ ටික කලකට හරි යමක් කරන්න උත්සාහ ගත් බවත් පෙනුනා. ඒත් දැන්නම් තත්ත්වය බරපතලයි. දැන් මේක අපිටත්, මෙහෙයුම් මණ්ඩලයටත් ඕනි නෑ වගේ ඇහෙන කොට හිතෙන්නේ. මේක සිංහල ගුවන් විදුලියක්ද කියලත් සැකයි. ශ්‍රී ලාංකික ප්‍රජාවගෙන් බහුතරය තවම භාවිතා කරන්නේ සිංහල භාෂාව කියලා යළි යළිත් මතක් කරන්න වෙලා තියෙන්නේ ඇයි.? භාෂා දෙකටම අසාධාරණයක් නොවන පරිදි වැඩසටහන් බෙදා ගන්න බැරි ඇයි.? මේක සිංග්‍රීසි වැඩ සටහනක් නොකර ඉංග්‍රීසි භාෂාවට සෙනසුරාදා වෙන්කොට ඉරිදා හොඳ වැඩසටහනක් සකස් කරන්න බැරි ඇයි.?

නොහැකියාව සහ වැඩසටහන් වල ඌනතාවය දැඩි ලෙස මතුවෙලා පෙනෙනවා. මේක වගකීමක් බව අමතක කරන්න එපා. හැමදාම වැඩ කරන්නේ ස්වෙච්ඡාවෙන්ය කියන එක නිදහසට කාරණයක් නොවේ. අනික් කරුණ නම් සෙනසුරාදා ඉරිදා 8 ට , 10 ට එකම කටහඬ ඇහෙන කොට දැනෙන්නේ දැඩි ඒකාකාරිත්වයක්.

කරුණාකර සම්පාදකවරු මේ ගැන හිතලා වැඩ කරන්න.